# ප්‍රාසංගික කලාවක් ලෙස හැඩ ගැසීමේ දී ඇති වූ නව ප්‍රවනතා







# ප්‍රාසංගික කලාවක් ලෙස හැඩ ගැසීමේ දී ඇති වූ නව ප්‍රවනතා

1.ශාන්ති කර්ම වලට සීමා වී තිබූ නර්තනය ප්‍රාසංගික නර්තන අංග ලෙස ප්‍රදර්ශනය කිරීම

2.දේශීය නර්තනයට මුද්‍රා නාට්‍ය,ඉගිනළු එකතුවීම





## 3.නව නිර්මාණ වන්නම් බිහිවීම

- මන්ත්‍රී වන්නම හංස වන්නම
- සමනළ වන්නම මරඟන වන්නම

## 4.නවතාවයකින් යුතුව ගැමි නැටුම් නිර්මාණය වීම







5.නර්තන ප්‍රසංග පැවැත්වීම

6.ගීත අනුව නර්තන නිර්මාණය වීම

7.සිද්ධි,අවස්ථා හා කර්මාන්ත ඇසුරින් නර්තන නිර්මාණය වීම



8.සංගීත සංදර්ශන සඳහා නර්තන ඉදිරිපත් කිරීම



# ශාන්ති කර්ම නර්තන අංග ප්‍රාසංගික වේදිකාවට ප්‍රවේශවීමේ දී ඇති වූ නව ප්‍රවනතා

- දීර්ඝ වේලාවක් ශාන්ති කර්ම රඟමඩලෙහි කල නර්තනය මිනිත්තු 05 කට පමණ සීමා වීම

- සාමූහික නර්තන අංග ඒකල නර්තන ලෙසද ඒකල නර්තන අංග සාමූහික නර්තන ලෙස ප්‍රතිනිර්මාණය වීම

- එකම නර්තන සම්ප්‍රදායක නර්තන අංග රැසක් එක්කොට එක් නර්තන අංගයක් ලෙස නිර්මාණය කිරීම

- පුරුෂ නර්තනයන් ස්ත්‍රී නර්තනයන් ලෙස නිර්මාණය වීම

- සම්ප්‍රදායයන් කිහිපයක නර්තන අංග එකතු කර ප්‍රාසංගික නර්තන අංගයක් නිර්මාණය කිරීම

- රංග රටා හා අවකාශ භාවිතය දක්නට ලැබීම
- වාද්‍ය භාණ්ඩ සම්මිශ්‍රණය කර ගනිමින් පසුබිම් වාදනය සකස් කර ගැනීම

# රංග වස්ත්‍රාභරණ විචිත්‍ර ලෙස නිර්මාණය වීම









- සම්ප්‍රදායික අංගහාරයන්ට නොගැළපෙන නිදහස් චලන රටා යොදා ගැනීම










# නව තාක්ෂණික ක්‍රමෝපායන් පදනම් කර ගනිමින් නර්තනයේ සිදු වූ නව ප්‍රවණතා



## රූපවාහිනිය වැනි දෘශ්‍ය මාධ්‍යයන්ගේ බලපෑම මත නර්තනයේ සිදු වූ නව ප්‍රවනතා

- ✓ ශාන්ති කර්ම,නර්තන වැඩ සටහන් ,ප්‍රවීණ නර්තන ශිල්පීන් සහභාගී වන වාර්තාමය වැඩ සටහන්,සාකච්ඡා මණ්ඩප විකාශනය කිරීම












✓ රූපවාහිනිය මගින් ඒ ඒ වයස් කාණ්ඩ වලට අදාළ නර්තන තරග පැවැත්වීම













වෙළඳ ප්‍රචාර කටයුතු සඳහා නර්තනය යොදා ගැනීම

- ✓ දුරස්ථ අධ්‍යාපනික අවස්ථා සම්පාදනය කරදීම

- ✓ නර්තනය තාක්ෂණික ක්‍රම සමඟ බද්ධ වීම මත වීඩියෝ නර්තනය නමින් නව විෂය ක්ෂේත්‍රයක් ඇතිවීම

- ✓ විවිධ ජාතීන්ට අයත් නර්තන වැඩ සටහන් රූපවානීය තුළින් විකාශනය කිරීම

## අන්තර්ජාල සම්බන්ධතා හේතුවෙන් ඇති වූ නව ප්‍රවනතා

- ✓ ලෝකයේ කොහේ හෝ ස්ථානයක ඇති නර්තන අංග අන්තර්ජාලය මගින් නිවසේ සිට නැරඹීමට හැකිවීම

- ✓ දේශීය ශාන්ති කර්ම,නර්තන විෂයය පිළිබඳ තොරතුරු,නව නිර්මාණ,වාදන විධි,පෙරහැර වැනි අවස්ථා අන්තර්ජාලය හරහා නැරඹීමට හැකිවීම

✓ දේශීය නර්තන අවස්ථා අන්තර්ජාලයට මුදා හැරීම මගින් ජාත්‍යන්තර වේදිකාවක් තනා ගැනීමට හැකිවීම

✓ අඩු පිරිවැයකින් වැඩි ප්‍රේක්ෂක පිරිසකට නැරඹීමට හැකිවීම

✓ දුරස්ථ අධ්‍යාපනය මගින් මාර්ගගත ඉගැන්වීම ඇතිවීම තුළින් ගුණාත්මක විෂයයය දැනුමක් ලබා ගැනීමට හැකිවීම

# වෙනත් තාක්ෂණික ක්‍රමෝපායයන් නිසා නර්තනයේ සිදු වූ නව ප්‍රවනතා







❖ සජීවී අත්දැකීම් වේදිකාව මත මැවීමට ගන්නා විවිධ තාක්ෂණික උපක්‍රම

- ➤ ස්මෝක් මැෂින්
- ➤ හේස් මැෂින්
- ➤ ස්නෝ මැෂින්
- ➤ විවිධ ප්‍රමාණයේ විදුලි පංකා
- ➤ ෆයර්ගන්
- ➤ කේබල් ක්‍රම
- ➤ ඉහල පහල ගෙන යා හැකි උපවේදිකා




• වේෂ නිරූපණය සඳහා යොදාගන්නා විවිධ ශිල්පීය ක්‍රම

- ➤ කෘතිම කොණ්ඩ, රැවුල්, ඇස්පිහාටු, දත් ආදී භාවිතය





- ➤ විවිධ ආලේපන ද්‍රව්‍ය භාවිතය





- විවිධ වේෂ නිරූපන උපකරණ භාවිතය





- ලේටෙක්ස් වැනි කෘතිම ද්‍රව්‍ය භාවිතය







- නව ශබ්ද තාක්ෂණය යටතේ බෙර හඬ පාලනය ගායනා ඉස්මතු කිරීම වැනි අවස්ථා වලදී තාක්ෂණික මෙවලම් යොදා ගැනීම.





- කලින් සකසන ලද තැටිගතකරන ලද සංගීත යොදා

➤ රංග වස්ත්‍රාභරණ සඳහා විවිධ ශිල්පීය ක්‍රම භාවිතය


- රංග වස්ත්‍ර සඳහා යොදා ගන්නා ලද අමුද්‍රව්‍ය වෙනස් වීම.
- රෙදි වර්ග , විසිතුරු ගල්, කලින් සකසන ලද විසිතුරු පැච් වර්ග ,රිබන් වගර්, බරිඩින්, විදුරු කොටස් ප්ලාස්ටික් හා ලෝහමය විසිතුරු කොටස් එක් කිරීම.

## අතීත රංග වස්ත්‍රාභරණ



## වර්තමාන රංග වස්ත්‍රාභරණ






## අතීත රංග වස්ත්‍රාභරණ






## වර්තමාන රංග වස්ත්‍රාභරණ










- සැහැල්ලු අමුද්‍රව්‍ය මගින් නිර්මාණය කර ගත් හිස් පළඳනා ආභරණ නිර්මාණය වීම.
- ඒ සඳහා රබර් ෂීට් වැනි අමුද්‍රව්‍ය භාවිතය.
- ලේසර් තාක්ෂණය මගින් වඩාත් නිමාවකින් යුතුව දේශීය කැටයම් හා විසිතුරු කොටස් එකතු කර ගැනීම.



- වෙස් මුහුණු වෙනුවට එයට ආදේශක වශයෙන් විවිධ අමුද්‍රව්‍ය යොදා ගනිමින් වෙස් මුහුණු නිර්මාණය කිරීම.

- සාම්ප්‍රදායික වර්ණවලින් බැහැරව විසිතුරු වර්ණ යොදා ගනිමින් ඇඳුම් නිර්මාණය කිරීම.





## විවිධ සංස්කෘතීන්ගේ බලපෑම හේතු කොටගෙන ඇතිවූ නව ප්‍රවනතා

- භාරතිය නර්තනයන්ගේ බලපෑම නිසා ප්‍රකාශනාත්මක නර්තන කලාවක් ඇතිවීම
- ගෝලියකරණයේ ප්‍රතිඵල ලෙස බටහිර චලන රටාව හා සම්බන්ධ වීම
- අපරදිග සංස්කිතියෙහි බලපෑම නිසා නිදහස් අංගචලන රටාවෙන් යුත් සමකාලින නර්තන ක්‍රමයන් ඇතිවීම.
- නර්තන රචනය, ඇඳුම් පැළඳුම් වේෂ නිරූපණ, පසුතල නිර්මාණ භාවිතයන්, විදුලි ආලෝක ක්‍රම ශිල්ප, පසුබිම් සංගීතය යන සියළු අංග සඳහා විවිධ සංස්කෘතින්ගේ බලපෑම ලැබී ඇති බව පෙනී යන්නකි.





# පැවරුම

01.නර්තන කලාවේ නව ප්‍රවනතා දෙකක් නම් කරන්න.

02.සමාජයීය අවශ්‍යතා සඳහා නර්තනය භාවිත කරන අවස්ථා දෙකක් නම් කරන්න.

03.ප්‍රාසංගික බව හා විවිධාංගිකරණය සඳහා භාවිතා වන තාක්ෂණික උපක්‍රම දෙකක් නම් කරන්න.

04.නව නිර්මාණයන් නර්තන කලාවේ ප්‍රගමනයට හේතු වන අයුරු විමසන්න.

05.ව්‍යවහාරික නර්තනය සමාජ,සංස්කෘතික හා ආර්ථික අංග කෙරෙහි බලපාන අයුරු විමසන්න.